# අනේ! අපේ රටේ සංචාරක හෝටල්!

*සුදු කලු සංචාරකයින් දෙදෙනා එකට ආවිට ඇය සුද්දාට පමණක් මල්මාලයක් දමා ඔහු පිළිගෙන ඉවත්ව ගියා ය !*





වසර ගණනාවක් පුරා ලංකාවෙ තිබුණු යුද්දෙ ඉවරවුණාට පස්සෙ ලංකාවට එන විදේශ සංචාරකයින්ගේ සංඛ්‍යාව හැම අවුරුද්දෙම ඉහළ යනවා. ගිය අවුරුද්දෙ ලක්ෂ අට හමාරක් සංචාරකයො ඇවිත් තියනවා. මේ අවුරුද්දෙ ලක්ෂ **10** කට වඩා එයි කියලා තමයි බලා පොරොත්තු වෙන්නෙ. කොයි තරම් සංචාරකයින් රටට ගොඩ බැස්සත් සංචාරක කර්මාන්තයෙ අඩුපාඩු කම් එමටයි. ඒවා හදාගන්න රජයේ ඉහළ තැන්වලට ඕනෑකමක් ඇති බවක් නම් පෙනෙන්නෙ නෑ.

හෝටල් කර්මාන්තයෙ දිහා බැලුවම රට පුරාම අළුත් හෝටල් හදනවා. තියන හෝටල් ලොකු කරනවා. තව කාමර එකතු කරනවා. සමහර ඒවා කඩලා අළුතෙන් තරු පහේ මට්ටමට හදනවා. වැඩ සීයයි. මේ මොනවා කළත් සේවා තත්වෙ දිහා බැලුවම ඒවායෙ තත්ව පාලනය, තත්ව කළමනාකරණය අන්තිමයි. ගන්න දෙයක් නෑ. හෝටල්වල පිරිසිදුකම, සංචාරකයින්ට අවශ්‍ය පහසුකම්, හෝටල් සේවකයන්ගෙ වෘත්තීය දැනුම, ආචාරශීලීබව ආදිය තව හුඟක් දියුණුවෙන්න ඕන. ඒවා කිසිසේත් සතුටුදායක තත්වයක නෑ. ලංකාවෙ හෝටල් කර්මාන්තයේ ඉන්න සේවකයන් බොහෝ දෙනා හිතන්නෙ හෝටලේ නවාතැන් ගන්න අය හෙවත් ඉංග්‍රීසියෙන් ගෙස්ට්ලා (Guests) හැටියට හඳුන්වන්නෙ සුදු හමක් තියන මිනිස්සු විතරය කියලා. ලංකාවෙ බොහොමයක් හෝටල්වලට ගියාම ලැබෙන පිළිගැනීම හා දක්වන ආචාරශීලීභාවය දිහා බැලුවම ලංකා සංචාරක හෝටල් සේවකයන්ගේ සේවය ජාත්‍යන්තර මට්ටමේ අහලකින්වත් තියන්න බෑ.

මේ දේවල් මම කියන්නෙ නිතර ලංකාවට ගිහිං, දිවයින පුරා ඇති සංචාරක හෝටල් ගණනාවකම නැවතී, මා දුටු සහ අත්දකින ලද කරුණු අනුවයි.

පසුගිය මාසෙ දෙවන සතියෙ මම ලංකාවට ගියා සති දෙකකට මෙහේ ලන්ඩනයේ අපිත් එක්ක වැඩකරන ඉංග්‍රීසි ජාතිකයෙකුත් එක්ක. කොළඹ තිබුණු අපේ වැඩ ටික ඉවරකරලා අපි කළුතර ගියා. එහිදී අපට නතරවෙන්න අපි කල් තියාම වෙන් කරලා තිබුණෙ කටුකුරුන්දෙ කානි ලංකා - අවානි හෝටලේ.

අපි දෙන්නා හෝටලේ ප්‍රධාන දොරටුවෙන් ඇතුල්වෙලා කාමර වෙන්කරපු වවුචර් එක පිළිගැනීමේ නිලධාරිනිය අතට දුන්නා. එයා ඒක බලලා තව නිලධාරියෙකුට කිව්වා ගෙස්ට්ලා දෙන්නයි කියලා. එයා දුවලා ඇතුළට ගිහිං පොල්කොළ මල්මාල දෙකක් ගෙනැත් එකක් අර මගේ සුදු යාළුවට දැම්මා. අනික් මල් මාලෙත් අරන් ආපහු ඇතුළට ගියා. එතන ඉන්න රිසෙප්ෂනිස්ට් හෙවත් පිළිගැනීමේ තරුණිය මගෙන් ඇහුවා " කෝ අනික් ගෙස්ට්? එයාටත් අපි මල්මාලෙ දාන්න ඕන.... කෝ එයා........? " කියලා.

මම කිව්වා, " මං දැන් දීපු වවුචර් එක බලන්න.. එතකොට අනික් ගෙස්ට් කවුද කියලා පෙනේවි....." කියලා. එතකොට පිළිගැනීමෙ නිලධාරිනිය ඒක බලලා කියනවා, " මම හිතුවෙ නෑ ඔයා ගෙස්ට් කෙනෙක් කියලා....හිතුවෙ මේ ඔයා ගෙස්ට්ලා අරන් එන ගයිඩ් කෙනෙක් කියලා......."

වවුචර් එකේ තිබුණෙ මගේ නම. මම අහුවා

"කොහොමද හිතුවෙ මම ගයිඩ් කෙනෙක් කියලා ? මගේ මූණෙ හරි ඇඳුම්මල හරි කොටලා තියනවද ගයිඩ් කියලා.....? මොකක් හරි එහෙම අඳුනා ගැනීමේ විශේෂ ලක්ෂණයක් තියනවද?" කියලා ඒකට ඒ ගෑණුකෙනා හරි ශෝක් උත්තරයක් දුන්නා. " එයා විදේශිකයෙක්නේ.... ඒකයි...! " කියලා.

ඒකෙන් මට පැහැදිලි වුණා, මේක සුදු හමට සලකන, සුද්දන්ට පමණක් නවාතැන් දෙන හෝටලයක් කියලා. මම ඇයට කිව්වා..

" එහෙම නම් මේ හෝටලේ ඉස්සරහ බෝඩ් එකක් ගහන්න

" සුද්දන්ට පමණයි.......
මෙහි එන අනික් අය
සියල්ලන්ම ගයිඩ්ලා වශයෙන්
සලකනු ලැබේ කියලා ........"

ඊළඟට මම කිව්වා මට මැනේජර් හරි වෙනත් විධායක නිලධාරියෙකුට කතාකරන්න ඕන කියලා. ඒකට දීපු පිළිතුර තමයි, ඒ සේරම එකට කෑමට ගියා... කවුරුවත් නෑ... කියලා. කීයටද එන්නෙ? කියලා ඇහුවම කිව්වා, කීයට ඒවිද දන්නෙ නෑ... කියලා. මේක මාර හෝටලයක් නේ. බාලාංශ පන්තියේ වගේ සේරම එකට යන්නෙ. මම කිව්වා " කමක් නෑ... ඒ අය ආවම කරුණාකර මට ඒ කාට හරි කතාකරන්න ඉඩ අරන් දෙන්න " කියලා.

*අපේ අයගේ ස්වභාවයෙන් එන දීනකම කවදාවත් යන්නෙ නැති පාටයි. හම සුදු කාට හෝ හතර ගාතෙ දාලා වඳින නිවටගතිය ලංකාවෙ හෝටල් සේවකයන්ගෙන් කවදාවත් මැකෙන්නේ නැති බව කාට වුවද ඉතා පැහැදිලිව පෙනේ.*

ඊට පස්සෙ සේවකයෙක් ඇවිත් අපිව බුක්කරපු කාමරේට එක්කගෙන ගියා. අපි වෙන්කරලා තිබුණේ **Twin Room** එකක් ඒ කියන්නේ තනි ඇඳන් දෙකක් ඇත්කරලා තියන ලොකු කාමරයක්. නමුත් කාමරේ ඇතුළට ගියාමයි දැක්කේ ඒ කියපු තනි ඇඳන් නෑ. ජෝඩුවක් නිදාගන්න ඩබල් බෙඩ් එකක් තියෙන්නෙ. මගේ සුදු යාළුවා හිනා-වෙන්න ගත්තා.

මම ඒ අපේ බඩුත් අරන් කාමරේට ආපු හාදයගෙන් ඇහුවා ඇයි මේ අපිට ඩබල් බෙඩ් එකක්? පිරිමි දෙන්නෙක් හරි, ගෑණු දෙන්නෙක් හරි ඩබල් ඇඳක නිදාගන්නවා නම් ඒ අය සමලිංගිකයො වෙන්න ඕන. අපි දෙන්නා එහෙම කට්ටිය නෙවෙයි කියලා. ඒ පාර ඒ සේවකයා ආයි පහළට දිව්වා. මේ කාමර ගැන මේ හෝටල්වල වැඩකරන අයට කිසිම දැනුමක් නෑ.

ඉතින් පැය දෙකකට විතර පස්සෙ අර කෑමට ගිය කට්ටියගෙන් එක විධායකයෙක් ඇවිත් වෙච්ච අත් වැරැද්දට සමාව ඉල්ලුවා. හරිම ලේසි ක්‍රමයක්. පොල් කොල මාලෙ සුද්දට විතරක් දාලා, ලාංකිකයා අවතක්සේරු කරලා, සමාව ඉල්ලනවා. මට මල්මාල ඕන නෑ නමුත් මොකක්ද ඒ කරපු අසික්කිත වැඩේ? අපේ අයගේ ස්වභාවයෙන් එන දීනකම කවදාවත් යන්නෙ නැති පාටයි. හම සුදු කාට හෝ හතරගාතෙ දාලා වඳින නිවටගතිය ලංකාවෙ හෝටල් සේවකයන්ගෙන් මැකෙන්-නෙම නෑ. මේ විදියට ලංකා හෝටල් සේවයේ තත්වය සේවා අනර්ඝත්වය කවදාවත් ජාත්‍යන්තර මට්ටමට ඒවිය කියලා හිතන්න අමාරුයි. ඒක නම් රජෝ මේ කපේදි වෙන්නෙ නෑ.

ශ්‍රීලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කරනවා කියලා ශ්‍රීලංකාවෙ අපේ රජය උදම් අනනවා. අපේ ජනතාවගෙ නිවට ආකල්ප කියනතුරා, අනිත් දේවල් කොහොම වුනත්, මේ පෙන්වා දුන් සංචාරක හෝටල් කර්මාන්තෙ දියුණු වුනොත් නම් ඉතින් ඒක සැබෑ ආශ්චර්යයක්ම තමයි!

♦ *ජෝර්ජ් කුමාරසිංහ*
**George Kumarasinghe**
*London E17*


ලංකාවිත්ති
LANKA VITHTHI

**පසළොස්වන සංවත්සරයට උණුසුම් සුබ පැතුම්!**



**පෙරේරා සහ සමාගම**
**PERERA & CO**
Solicitors
**301 Romford Road**
**Forest Gate**
**London E7 9HA**
**Tel. 020 8503 0030**


## අවමංගල්‍ය ! Obituary !



**Dr Seneviratna Bandara Dissanayake**
**වෛද්‍ය සෙනෙවිරත්න බණ්ඩාර දිසානායක මහතා**
**Born 7th June 1931**
**Died 17th March 2012**

Seneviratne Bandara Dissanayake (known as **"Doctor"** or **"Senerath"** to friends and family) passed away peacefully in his sleep on the **17th March 2012** in the UK.

An alumnus of Trinity College, Kandy and Colombo University Medical School, he served the community faithfully as a General Practitioner in South London for many years before retiring to Sri Lanka where he devoted his final years to caring for his wife, Ariya (**Mrs. Ari Dissanayake**)

His funeral service was held at North East Surrey Cemetery (Crematorium), Morden, Surrey, on 31st March 2012.

He is survived by his wife Mrs. Ari Dissanayake, his daughters Lakmalie (Lucky), Shiromalie and his son Dr. Sanjeeva Dissanayake.

**May he attain supreme Nibbana !**

## අවමංගල්‍ය ! Obituary !



**නීතිඥ දීපාල් විජේරත්න මහතා**

*ලංකා හාම්පුතුන්ගේ සංගමයේ සහකාර අධ්‍යක්ෂක ජෙනරාල්*

ඉනෝකාගේ දයාබර සැමියා වූද, දිනිති සහ දිනෙත්ගේ ආදරණීය පියාණන් වූද, නන්ද සහ මානෙල් විජේරත්නගේ ආදරණීය පුතණුවන් වූද, සමන්ත ලතිකා සහ සමිතගේ සොහොයුරු වූද, නැසීගිය ලෙනාඩ් ගුණතිලක ඔලිව් ගුණතිලක යුවළගේ බෑණනුවන් වූද, මහින්ද පුංචිහේවා ප්‍රියංගා මුණසිංහ රන්ජිත් සහ ශෙහෙරා ඇඹුල්දෙණියගේ මස්සිනාවූද නීතිඥ දීපාල් විජයරත්න මහතා ගිය මස අභාවප්‍රාප්ත විය. අවසන් කටයුතු ගල්කිස්ස සුසාන භූමියේදී සිදුවිය.

**දීපාල් විජේරත්න මහතාට උතුම්වූ නිවන් සැප ලැබේවා !**